# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/7/1/4 | ඔබේ අංකය<br>உனது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023.05. 16 |
|---|---|---|---|---|---|

**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 02/2023**

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්,
ගණන් දීමේ නිලධාරීන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියළුම ප්‍රඥප්තිගත ආයතන ප්‍රධානීන් වෙත.

**රාජකාරී විදේශ ගමන් සඳහා විනිමය මුදා හැරීම හා ඒ ආශ්‍රිත වියදම්**

සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්ට ද පිටපත් සහිතව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් ආමන්ත්‍රිත, උක්ත ශීර්ෂයෙන් යුතු ජනාධිපති ලේකම්ගේ අංක පීඑස්/සීඑස්ඒ/00/1/4/8 දරන 2023.03.15 දිනැති ලිපිය හා බැඳේ. (අදාළ ලිපි පිටපත අමුණා ඇත.)

02. ඒ අනුව, වර්තමානයේ රටේ පවත්නා ආර්ථික හා මූල්‍ය දුෂ්කරතා මත රජයේ අරමුදල් අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා පමණක් ඉතා අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කළ යුතුව ඇති බැවින්, නිල දූත කාර්යයන් හා රාජකාරී, සාකච්ඡා, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් ඇතුළු සියළුම රාජකාරී කටයුතු සඳහා විදේශගත වීමේ දී ගෙවනු ලබන දීමනා සීමා කිරීමට ගරු ජනාධිපතිතුමා විසින් තීරණය කර ඇති බවත්, උක්ත කරුණ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා භාණ්ඩාගාරයේ ලේකම් විසින් නිකුත් කර ඇති 2015.05.15 දිනැති අංක මු.අ.01/2015/01 දරන චක්‍රලේඛයේ සඳහන් මතු දැක්වෙන විධිවිධාන පහත පරිදි සංශෝධනය කිරීමට ගරු ජනාධිපතිතුමා විසින් නියම කර ඇති බවත් දන්වා ඇත.

I. **03 ඡේදය - අනියම් දීමනා ගෙවීම.**

- 03 (අ) උප ඡේදයෙහි සඳහන් අනියම් වියදම් පියවා ගැනීම සඳහා එක් දිනකට ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 25 ක් බැගින් උපරිම දින 15 ක් දක්වා අනියම් දීමනාව ගෙවිය යුතුය.

- 03 (ආ) උප ඡේදයෙහි සඳහන් අනියම් වියදම් පියවා ගැනීම සඳහා එක් දිනකට ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 40 ක් බැගින් උපරිම දින 10 ක් දක්වා අනියම් දීමනාව ගෙවිය යුතු ය.

II. **04 ඡේදය - සංයුක්ත දීමනා ගෙවීම**

- 04 (අ) උප ඡේදයෙහි දැක්වෙන වගුවෙහි දෙවන හා තුන්වන තීරුවල සඳහන් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් වලින් ගෙවනු ලබන දීමනා 30% කින් අඩු කර ගෙවිය යුතු ය.

- 04 (ඉ) උප ඡේදයෙහි සඳහන් ශිෂ්‍යත්වයක් සඳහා විදේශ රජයන් හෝ ප්‍රදායක ආයතනයන් විසින් අනියම් දීමනා නොගෙවන අවස්ථාවල දී, විදේශගත වන නිලධරයෙකුට අනියම් වියදම් පියවා ගැනීම සඳහා එක් දිනකට ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 25 ක් බැගින් උපරිම දින 10 ක් දක්වා අනියම් දීමනාව ගෙවිය යුතු ය.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

III. <u>05 ඡේදය - සංග්‍රහ දීමනාව</u>

නිල චාරිකාවක දී දූත පිරිසට නායකත්වය දෙන අමාත්‍යවරයාට හෝ ලේකම්වරයාට හෝ එම නිල චාරිකාවේ දී සංග්‍රහ වියදම් දැරීමට සිදු වන්නේ නම් අදාළ රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 750 ක මුදල් ප්‍රතිපාදන ලබා දිය හැකි අතර, අදාළ රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් නොමැතිනම්, ගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරනු ලබන නිල දූත පිරිසෙහි නායකත්වය දරන අමාත්‍යවරයාට හෝ ලේකම්වරයාට හෝ ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 750 ක් සඳහා වූ මුදලක් සංග්‍රහ දීමනා වශයෙන් ගෙවිය හැකි ය.

03. තවද, ප්‍රදායක ආයතනය විසින් පූර්ණ පිරිවැය දරනු නොලබන විදේශ අධ්‍යයන/ පුහුණු/ සාකච්ඡා/ සම්මන්ත්‍රණ/ සංචාර සඳහා දේශීය අරමුදල් මඟින් වියදම් දරමින් රජයේ නිලධාරීන් සහභාගී නොකළ යුතු බවත් එකී ලිපිය මඟින් දන්වා ඇත.

04. ඉහත 02 ඡේදය යටතේ වන I, II හා III කරුණු සහ 03 ඡේදය යටතේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් මින් පෙර නිකුත් කර ඇති චක්‍රලේඛ හෝ උපදෙස් ලිපිවල සඳහන් විධිවිධාන 2023 මාර්තු මස 20 වැනි දින සිට බලරහිත වන බවත් එමඟින් වැඩිදුරටත් දන්වා ඇත.

05. ඒ අනුව, ජනාධිපති ලේකම්ගේ අංක පීඑස්/සීඑස්ඒ/00/1/4/8 දරන 2023.03.15 දිනැති ලිපියේ සඳහන් කරුණු අනුව කටයුතු කිරීමට ඔබ ආයතනය යටතේ ඇති සියළුම ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

දුරකථන : 091-49 44 007
ෆැක්ස් : 091-22 32 691
විද්‍යුත් තැපැල : depoffinance7@gmail.com

ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/4/8

2023 මාර්තු මස 15 වන දින

ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

**රාජකාරි විදේශ ගමන් සඳහා විනිමය මුදා හැරීම හා ඒ ආශ්‍රිත වියදම්**

උක්ත කරුණ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ භාණ්ඩාගාරයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2015 මැයි මස 15 වන දිනැති අංක : මු.අ. 01/2015/01 දරන චක්‍රලේඛය හා බැඳේ.

02. වර්තමානයේ රටේ පවත්නා ආර්ථික හා මූල්‍ය දුෂ්කරතා මත රජයේ අරමුදල් අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා පමණක් ඉතා අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කළ යුතු බැවින්, නිල දූත කාර්යයන් හා රාජකාරි, සාකච්ඡා, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් ඇතුළුව සියළුම රාජකාරි කටයුතු සඳහා විදේශගත වීමේදී ගෙවනු ලබන දීමනා සීමා කිරීමට ගරු ජනාධිපතිතුමා තීරණය කර ඇත.

03. ඒ අනුව, 2023 මාර්තු මස 20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උක්ත චක්‍රලේඛයෙහි සඳහන් මතු දැක්වෙන විධිවිධාන පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට ගරු ජනාධිපතිතුමා විසින් නියම කර ඇති බව කාරුණිකව දන්වමි.

(I) 03 ඡේදය - අනියම් දීමනා ගෙවීම

- 03 (අ) උප ඡේදයෙහි සඳහන් අනියම් වියදම් පියවා ගැනීම සඳහා එක් දිනකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 25 ක් බැගින් උපරිම දින 15 ක් දක්වා අනියම් දීමනාව ගෙවිය යුතුය.

- 03 (ආ) උප ඡේදයෙහි සඳහන් අනියම් වියදම් පියවා ගැනීම සඳහා එක් දිනකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 40 ක් බැගින් උපරිම දින 10 ක් දක්වා අනියම් දීමනාව ගෙවිය යුතුය.

(II) 04 ඡේදය - සංයුක්ත දීමනා ගෙවීම

- 04 (අ) උප ඡේදයෙහි දැක්වෙන වගුවෙහි දෙවන හා තුන්වන තීරුවල සඳහන් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් වලින් ගෙවනු ලබන දීමනා 30% කින් අඩු කර ගෙවිය යුතුය.

- 04 (ඉ) උප ඡේදයෙහි සඳහන් ශිෂ්‍යත්වයක් සඳහා විදේශ රජයන් හෝ ප්‍රදායක ආයතනයන් විසින් අනියම් දීමනා නොගෙවන අවස්ථාවලදී, විදේශගත වන නිලධාරියෙකුට අනියම් වියදම් පියවා ගැනීම සඳහා එක් දිනකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 25 ක් බැගින් උපරිම දින 10 ක් දක්වා අනියම් දීමනාව ගෙවිය යුතුය.

(III) 05 ඡේදය - සංග්‍රහ දීමනාව

නිල චාරිකාවක දී දූත පිරිසට නායකත්වය දෙන අමාත්‍යවරයාට හෝ අමාත්‍යාංශ ලේකම්වරයාට එම නිල චාරිකාවේ දී සංග්‍රහ වියදම් දැරීමට සිදු වන්නේ නම්, අදාළ රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 750 ක මුදල් ප්‍රතිපාදන ලබා දිය හැකි අතර, අදාළ රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් නොමැති නම්, ගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරනු ලබන නිල දූත පිරිසෙහි නායකත්වය දරන අමාත්‍යවරයාට හෝ ලේකම්වරයාට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 750 ක් සඳහා වූ මුදලක් සංග්‍රහ දීමනා වශයෙන් ගෙවිය හැකිය.

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01

දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873

ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657

ඊ-තැපෑල / மின்னஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

Scanned with CamScanner

04. තවද, ප්‍රදායක ආයතනය විසින් පූර්ණ පිරිවැය දරනු නොලබන විදේශ අධ්‍යයන / පුහුණු / සාකච්ඡා / සම්මන්ත්‍රණ / සංචාර සඳහා දේශීය අරමුදල් මගින් වියදම් දරමින් රජයේ නිලධාරීන් සහභාගි නොකළ යුතුය.

05. ඉහත 03 සහ 04 ඡේදයන්හි සඳහන් විධිවිධානවලට අදාළව මීට පෙර නිකුත් කර ඇති චක්‍රලේඛ හෝ උපදෙස් ලිපිවල සඳහන් විධිවිධාන 2023 මාර්තු මස 20 වැනි දින සිට බලරහිත වන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

ඊ එම් එස් බී ඒකනායක
ජනාධිපති ලේකම්

පිටපත් :

| | | | |
|---|---|---|---|
| 1 | අග්‍රාමාත්‍ය ලේකම් | - | කරු. අවශ්‍ය කටයුතු සඳහා |
| 2 | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් | - | කරු. අවශ්‍ය කටයුතු සඳහා |
| 3 | සියළුම අමාත්‍යාංශ ලේකම්වරු | - | කරු. ඉහත විධිවිධාන අනුව කටයුතු කරන ලෙස ඔබ අමාත්‍යාංශය / ආයතනය යටතේ ඇති සියළුම දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ අනෙකුත් ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම සඳහා |
| 4 | සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් | - | කරු. ඉහත විධිවිධාන අනුව කටයුතු කරන ලෙස ඔබ පළාත් සභාව යටතේ ඇති සියළුම පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ අනෙකුත් ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම සඳහා |
| 5 | පාර්ලිමේන්තු මහලේකම් | - | කරු. අවශ්‍ය කටයුතු සඳහා |
| 6 | විගණකාධිපති | - | කරු. අවශ්‍ය කටයුතු සඳහා |

Scanned with CamScanner